**කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ උප වගන්තිය 172(1) සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට කෝරළෙයි පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් පුස්තකාල 08ක් සඳහා සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණු රු.1,690,590ක් වටිනා පොත් 4,871ක් සහ මිල සඳහන් නොවූ පොත් 576ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඊළඟ වර්ෂයේදී අවසන් ගිණුම් වාර්තාවල වත්කම් ලෙස එකතු කිරීමට කටයුතු කරන බව. | පරිත්‍යාග ලද පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.703,498ක්වූ වර්ග 185ක පාරිභෝගික භාණ්ඩ 3,667ක් සහ රු.339,430ක් වූ වර්ග 31ක විදුලි බුබුළු 471ක තොගය මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඊළඟ වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තොගයේ වටිනාකම ගිණුම්වල දැක්වීමට පියවර ගත යුතුය. |
| (ඇ) | පෞද්ගලික දුරකථන සන්නිවේදන සමාගම් 03 කින් 2010 සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා අයවිය යුතු ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු.420,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඊළඟ වර්ෂ ගිණුම්වල දැක්වීමට කටයුතු කරන බව. | අයකළ යුතු ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ගිණුම්වල දැක්වීමට පියවර ගත යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රකාරව වර්ග 94 ක භාණ්ඩ 360ක් වෙන්දේසි කර තිබූ නමුත් එහි පිරිවැය වත්කම්වල වටිනාකමින් අඩුකර දක්වා නොතිබුණි. | වෙන්දේසි කර තිබූ භාණ්ඩ සම්බන්ධයෙන් එහි පිරිවැය තක්සේරු කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙන්දේසි කර තිබූ භාණ්ඩවල වටිනාකම අඩුකිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වැය විෂයන් 02ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ශේෂයන් සහ අනුරූපී ලේඛනවල වටිනාකම්වල ශේෂයන් අතර එකතුව රු.4,879,202ක වෙනසක් පැවැතුණි. | මෙය නිවැරදි කරන බව. | විචලනයන් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

## 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.25,548,271 ක් වටිනා ගිණුම් ශේෂ 06කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වලට අදාල ලේඛන නඩත්තු කර දෝෂයන් නිවැරදි කරමින් පවතින බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය | සභාව විසින් එහි පරිපාලන බල ප්‍රදේශයේ පවතින මාර්ග 740ක් සලකුණු කර ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | මාර්ගවල මැනුම් කටයුතු සිදුකර අවසන් වූ පසුව ගැසට් පත්‍රයේ පලකිරීමට කටයුතු කරන බව. | මාර්ග සලකුණු කර ගැසට්පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | සන අපද්‍රව්‍ය සම්බන්ධව ලබාදුන් එකතුව රු.3,344,907ක අත්තිකාරම් ගෙවීම් 41ක් හඳුනාගෙන නිරවුල් කිරීමට වර්ෂ 19කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | අනාවරණය කර තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි රු.2,036,374ක කල් ඉකුත් වූ වර්ග 06ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | අනාවරණය කර තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 45,931,332ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,660,398ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන් තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස් කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| වරිපනම් හා බදු | 1,700,000 | 1,043,235 | 1,043,235 | - | 1,790,000 | 873,150 | 873,150 | - |
| කුලී | 11,924,000 | 30,350,442 | 9,013,814 | 21,336,628 | 11,934,000 | 8,230,835 | 7,620,649 | 18,399,540 |
| බලපත්‍ර ගාස්තු | 3,739,000 | 6,169,256 | 6,169,256 | - | 3,764,000 | 6,203,421 | 6,202,421 | - |
| වෙනත් ආදායම් | 27,695,000 | 11,898,919 | 11,353,919 | 545,000 | 32,838,000 | 82,331,253 | 76,882,874 | 7,954,014 |
| **එකතුව** | 45,058,000 | 49,461,852 | 27,580,224 | 21,881,628 | 50,326,000 | 97, 638,659 | 91,579, 094 | 26,353,554 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 අගෝස්තු 31 දිනැති අංක 1,826 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, ග්‍රාම සේවා වසම් 12ක් සංවර්ධිත ප්‍රදේශ ලෙස ප්‍රසිද්ධ කර තිබූ නමුත් එම ප්‍රදේශයේ දේපළ තක්සේරු කර වරිපනම් බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | වර්තමානයේ වරිපනම් බදු අයකිරීම් පිළිබඳව නිසි ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින බව. | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| (i) | සභාවට අයත් කඩකාමර 58ක කුලී හිමියන්ගෙන් අයවිය යුතු රු.1,788,535ක් වර්ෂ 02කට අධික කාලයක සිට අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | අනාවරණය කර තිබූ අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගනු ලබන බව. | හිඟහිටි අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ii) | 2013 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය දක්වා බදුකුලී හිමියන් 55ක ගෙන් අයවිය යුතු හිඟ බදුකුලී ආදායම් රු.20,019,479ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) | සභාව සතු වාහන කුලියට දීමෙන් ලැබිය යුතු හිඟ වාහනකුලී රු.1,317,150ක් වර්ෂ 03කට අධික කාලයක සිට අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iv) | සභාවට අයත් ගවමස් කඩයක් හා කුකුළු මස්කඩ 20ක් කුලියට දීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දක්වා පැවැති අත්තිකාරම් රු.509,634ක් විධිමත් අනුමැතිය සහ සභාවේ තීරණ රහිතව සභාව විසින් කපාහැර තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගනු ලබන බව. | ලැබිය යුතු අත්තිකාරම් අයකර ගැනිමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂවල ස්ථාවර තැන්පතු සඳහා සියයට 20ක් හෝ ඊට වැඩි පොලී ප්‍රතිශතයක් ලබාදී තිබූ නමුත් සභාව විසින් මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යන එකතුව රු. 4,497,520ක ස්ථාවර තැන්පතු නව පොලී ප්‍රතිශතවලට අනුව ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාමට පියවර නොගැනීමෙන් ආසන්න වශයෙන් රු.449,750ක පොලී ආදායම් අහිමිවී තිබුණි. | ස්ථාවර තැන්පතුවලට නොවෙනස් වැල්පොලී පදනමින් තැන්පත් කර ඇති බැවින් සඳහන් කළ පොලී අනුපාතයන්ම ලැබෙන බැවින් අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගනු ලබන බව. | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ 1968 අංක 14 දරන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් ලියාපදිංචි කළ ආපන ශාලා හෝ නවාතැන්වල සමස්ත ආදායමෙන් සියයට එකක් නොඉක්මවන බලපත්‍ර ගාස්තුවක් අයකර ගත යුතු වුවත් මෙයට පටහැනිව සංචාරක ක්ෂේත්‍රවලට අයත් ආයතන සහ සේවා සපයන්නන් ඇතුළුව 14 ගෙන් රු.100,000ක් වන ස්ථාවර බලපත්‍ර ගාස්තු පදනමින් වාර්ෂිකව සභාව විසින් අයකර තිබුණි. | සංචාරක නවාතැන්වල බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් රටෙහි පසුගිය කාලවල පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් අයකිරීම්වල කාලප්‍රමාදයන් සිදුවූ බව සත්‍යයක් වන අතර වර්තමානයේ නිසි පියවර ගෙන ඇති බව. | පනත ප්‍රකාරව සංචාරක නවාතැන්වල බලපත්‍ර ගාස්තු අයකර ගත යුතුය. |
| (ඈ) | සභාව විසින් එළැඹ තිබූ බදුකුලී ගිවිසුම් අනුව බදුකුලී නොගෙවන බදුකරුවන්ගෙන්, අදාල හිඟ බදුකුලී මුදලින් සියයට 10 ක දඩ මුදලක් අයකළ යුතු වුවත්, වර්ෂ 05කට අධික හිඟ බදුකුලී රු.20,808,013 කින් කිසිදු දඩ මුදලක් සභාව විසින් අයකර නොතිබුණි. | සභාව විසින් එළැඹ තිබූ බදුකුලී ගිවිසුම් අනුව, බදුකුලී නොගෙවන බදුකරුවන්ගෙන්, අදාල හිඟ බදුකුලී මුදලින් සියයට 10 ක දඩ මුදලක් සමග අයකිරීමට කටයුතු කරන බව. | හිඟ බදුකුලී මත දඩ මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාව විසින් වාර්ෂිකව රැස්කරනු ලබන ප්ලාස්ටික් අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 398ක්, පොලිතීන් අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 133ක් ප්‍රතිචක්‍රීකරණයට ලක්කිරීමටත් නැතහොත් විකල්ප ක්‍රියාමාර්ගවල යෙදවීමටත් සහ දිරාපත්වන කසල මෙට්‍රික් ටොන් 423ක් කාබනික පොහොර සැකසීමටත් යොදවා ආදායම් ඉපැයීමට පියවර ගෙන නොතිබුණි. | කාබනික පොහොර මධ්‍යස්ථානය විස්තීර්ණය කිරීමට පසුගිය වර්ෂයේ ඇස්ත මේන්තු කර තිබූ නමුත් ප්‍රමාණවත් ආදායම් නොමැති වීමෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේම, මෙම වර්ෂයේ නිසි පියවර ගනු ලබන බව. | ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට ලක්කර ආදායම් ඉපැයීමට පියවර ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබී තිබූ ගොඩනැගිලි අයදුම්පත්‍ර 328කින් 156කට පමණක් සභාව අනුමැතිය ලබාදී තිබුණි. ඉතිරි අයදුම්පත් නැවත ඉදිරිපත් නොකිරීම, ඉඩම් ගැටළු, ලේඛනවල අඩුපාඩු සහ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමාදයන් වැනි හේතුන් නිසා අනුමැතිය ලබාදී නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගනු ලබන බව. | ගොඩනැගිලි අයදුම්පත්‍ර සඳහා ප්‍රමාදයකින් තොරව අනුමැතිය ලබාදීමට පියවර ගත යුතුය. |
| (ආ) | 1915 අංක 15 දරන නිවාස හා නාගරික සංවර්ධන ආඥාපනතේ 15(1) වගන්තිය ප්‍රකාරව, පනතේ විධිවිධාන අනුව ගොඩනැගිල්ල ඉදිකර තිබේද යන්න සනාථ කර පදිංචියට සුදුසු සහතිකය (COC) නිකුත් කළ යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සංවර්ධන අනුමැති පත්‍ර 156ක් ලබාදී තිබූ නමුත් ඉන් 02කට පමණක් පදිංචියට සුදුසු සහතිකය නිකුත් කර තිබුණි. | -එම- | පනතේ විධිවිධාන ප්‍රකාරව ගොඩනැගිලි ඉදිකර තිබේද යන්න සනාථ කර පදිංචියට සුදුසු සහතිකය නිකුත් කිරීමට පියවර ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය සහ සභාවේ අරමුදල් ප්‍රතිපාදනයෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ අරමුණින් 2022 වර්ෂ යේ රු.1,200,000ක් වැයකර මිලදීගත් අන්තර්ජාල පැකේජය ස්ථාපිත කර එමගින් රු.20,019,478ක හිඟ ආදායම් අයකර ගැනීමට පියවර නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | වත්කම් නියමිත අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා මිලදීගත් රු.1,082,500 කි වටිනා මල්ටි චොපර් යන්ත්‍රය (Multi Chopper) සහ කැරකෙන පෙරන යන්ත්‍රය Rotating Strainer) ඝන අපද්‍රව්‍ය ක්‍රියාකාරකම්වල යෙදවීමට වර්ෂ 03කට අධික කාලයක් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා මිලදීගත් යන්ත්‍ර කඩිනමින් භාවිතා කිරීමට පියවර ගනු ලබන බව. | යන්ත්‍ර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා යෙදවීමට පියවර ගත යුතුය. |
| (ඇ) | වාහන අළුත්වැඩියා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් වර්ග 14ක රු.1,793,646ක්වූ උපකරණ සහ ජලය පොම්ප කිරීමේ යන්ත්‍ර භාවිතයකින් තොරව සභා ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. | වාහන අළුත්වැඩියා මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවසන් වූ වහාම උපකරණ භාවිතා කිරීමට පියවර ගනු ලබන බව. | උපකරණ භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය යට තේ රු.16,253,511ක් වැයකර ඉදිකළ බහුළුම් කඩකාමර 04ක් යෝජිත පරිදි නියමිත ප්‍රතිලාභීන් 16කට ලබාදී ආදායම් ඉපැයීමට විගණන දිනටත් සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | ඉතාමත් ඉක්මනින් ප්‍රතිලාභීන්ට මෙම කඩකාමර සංකීර්ණය ලබාදෙනු ලබන බව. | සභාවේ ආදායම් මූලාශ්‍ර මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01 සිට 05ක් දක්වා කාලයක් සභාව සතු අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ වාහන 06ක්, ට්‍රේලර් 10ක් සහ ජල බවුසර් ආදිය අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේ PSDG ව්‍යාපෘතියට අනුව අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය සඳහා කටයුතු කරන බව. | වාහන අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂ 10ක සිට පරිහරණය කළ නොහැකි තත්ත්වයේ පැවැති ට්‍රැක්ටරය වෙන්දේසියේ විකිණීමට හෝ අපහරණය සඳහා කටයුතු කර නොතිබුණි. | -එම- | අළුත්වැඩියා කළ නොහැකි ට්‍රැක්ටර අපහරණය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | බෙත්තාලෙයි සහ කිරාන් සංස්කෘතික ශාලාවට ආසන්නයේ පිහිටි සභාව සතු ළමා උද්‍යාන 02හි පවතින අක්‍රියවූ ක්‍රීඩා උපකරණ අළුත්වැඩියා කර ළමුන්ගේ පරිහරණය සඳහා ලබාදීමට පියවර ගෙන නොතිබුණි. | ඔබගේ අදහස් පරිදි කඩිනමින් ළමා උද්‍යාන අළුත්වැඩියා කිරීමට පියවර ගනු ලබන බව. | ළමා උද්‍යානවල අක්‍රියවූ ක්‍රීඩා උපකරණ අළුත්වැඩියා කර පරිහරණය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමින් වූ වාහන 16ක්, ට්‍රේලර් 13 සහ ජල බවුසර්වල අයිතිය සභාවට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඔබගේ අදහස් පරිදි වාහනවල අයිතිය සභාවට පවරා ගැනීමට පියවර ගනු ලබන බව. | සභාව සතු වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර පළාත් සභාවේ 2017 සැප්තැම්බර් 21 දිනැති අංක PT/04(1)/2017 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සඳහා අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේ රු.20,666,057ක භාණ්ඩ හා සේවාවන් 247ක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට නිසි පියවර ගනු ලබන බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | නැගෙනහිර පළාත් සභාවේ 2017 සැප්තැම්බර් 21 දිනැති අංක PT/04(1)/2017 දරන චක්‍ර ලේඛ යේ 05 ඡේදය ප්‍රකාරව, තාක්ෂණික ඇගැයීම් කමිටුවට (TEC) විෂය කරුණු පිළිබඳ දැනුමක් සහිත පුද්ගලයෙකු ඇතුළත් කළයුතු වූවත්, එලෙස ඇතුළත් නොකර අවස්ථා 09කදී විදුලි උපකරණ රු.2,050,645කට මිලදී ගෙන තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2021 අගෝස්තු 08 දිනැති අංක PT/04(6)/2021 දරන නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍ර ලේඛය ප්‍රකාරව, රු.500,000ක් දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා පමණක් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට නිර්දේශ කළහැකි බව සඳහන් වූවත්, ඊට පටහැනිව එම සීමාව ඉක්මවා රු.1,058,450කට ප්‍රසම්පාදනයක් සිදුකර තිබුණි. | -එම- | -එම- |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ දිරිගැන්වීමේ වැඩසටහන යටතේ වැසිකිලි ප්‍රතිසංස්කරණ කටයුතු, මාර්ගවලට නාමපුවරු සවිකිරීම් සහ ළමා උද්‍යාන ඉදිකිරීම් ආදි වැඩසටහන් නිම වූ බවට වාර්තා ඉදිරිපත් කර 2017 වර්ෂයේදී අක්මුදල් ලබා ගැනීමෙන් තැන්පත් කළ මුදලින් රු.750,000ක් වටිනා කාර්යයන් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අවසන් කර නොතිබුණි. | 2016 වර්ෂයේ දිරිගැන්වී මේ වැඩසටහන යටතේ නිම නොවී පවතින වැඩසටහන් කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | ආරම්භ කළ වැඩසටහන් නියමිත කාල වකවානු තුළ අවසන් කිරීමට පියවර ගත යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 09ක්ද, ද්විතියිකමට්ට මේ තනතුරු පුරප්පාඩු 06ක් වශයෙන් තනතුරු 15ක් පුරප්පාඩුවී තිබීමෙන් පොදු ජනතාවට සපයනු ලබන සේවාවන් දුර්වල තත්ත්වයේ පැවතුණි. | කාර්ය මණ්ඩල අවශ්‍යතා සහ පුරප්පාඩු පැවැති නමුත් රටෙහි ආර්ථික ප්‍රතිපත්ති සහ ඉදිරි අනාගතයේදී සිදුවන වෙනස් වීම්වලට අනුව ක්‍රියාමාර්ග ගනු ලබන බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමර්ග ගත යුතුය. |
| (ආ) | සභාව විසින් නිලධාරීන් 19කට ලබාදුන් ආපදා සහ අනෙකුත් ණය ශේෂ එකතුව රු.28,467ක් වර්ෂ 10ක සිට අයකර ගැනීමට සහ සේවයේ යෙදී සිටියදී මියගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.141,970ක් පසුගිය වර්ෂ 06කට අධික කාලයක සිටත් අයකර ගැනිමට පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි සේවක ණය අයකර ගැනීමට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟහිටි සේවක ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරන පනතෙන් සහ 2000 අංක 53 දරන පනතෙන් සහ 2008 අංක 01 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක වන රෙගුලාසිවලට අනුකූලව ලී මෝල් 31ක්, හාල් මෝල් 04ක් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් ආයතන 01ක් විසින් කල් ඉකුත් වූ පාරිසරික බලපත්‍ර | ඉදිරි කාලයේදී අවශ්‍ය කටයුතු සිදුකරන බව. | පරිසර ආරක්ෂක බලපත්‍ර ලබාගැනීමට සහ අළුත්කිරිමට කටයුතු කළ යුතුය. |

අළුත්කිරීමට පසුගිය වර්ෂ 02 සිට 07ක් දක්වා පියවර ගෙන නොතිබුණි. එසේම, ඉහත පන තේ රෙගුලාසි සහ 2022 ජනවාරි 27 දිනැති සහ 2264/18 අංක දරන විශේෂ ගැසට් පත්‍රයේ ‘‘ආ’’ වගන්තිය ප්‍රකාරව, බේකරි 05ක් සහ ඇඹරුම්හල් 05ක් සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.